පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ලංකා ඉතිහාසය I (I කොටස) | 25 | S | I

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය :

| | | | | |
|---|---|---|---|---|
| 1) 04 | 2)01 | 3)03 | 4)02 | 5)04 |
| 6)03 | 7)05 | 8)02 | 9)01 | 10)04 |
| 11) 03 | 12)01 | 13)05 | 14)03 | 15)03 |
| 16)02 | 17)05 | 18)03 | 19)05 | 20)03 |
| 21) 04 | 22)03 | 23)05 | 24)01 | 25)04 |
| 26) 01 | 27)04 | 28)01 | 29)02 | 30)04 |
| 31) 02 | 32)03 | 33)05 | 34)04 | 35)03 |
| 36) 03 | 37)01 | 38)02 | 39)03 | 40)01 |

ශ්‍රේණිය 12

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ලංකා ඉතිහාසය I (II කොටස) | 25 | S | II


පාසලේ නම : ...................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 3

## A කොටස

01)



## B කොටස

02) **i)** අභිලේඛන

- අභිලේඛන යනු සෙල්ලිපි, රන්පත්, තඹපත්, කුරුටු ගී යනාදිය යි. අදාළ ඓතිහාසික සිද්ධි වලට ආසන්න කාලවලදී නිර්මාණය වීමත් සාහිත්‍ය මූලාශ්‍ර වලට සාපේක්ෂව අතිශයෝක්තිය අඩුවීමත් නිත්‍ය කරුණු වාර්තා කර තිබීමත් නිසාම මේවා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතුරින් වඩාත් විශ්වසනීය මූලාශ්‍ර වර්ගය ලෙස සැලකේ.
- වංශකතා වල අඩංගු සාවද්‍ය තැන් නිවැරදි කර ගැනීම හා අතිරේක තොරතුරු ලබා ගැනීම සඳහා අභිලේඛන පිටුබලයක් වේ.
- සාහිත්‍ය මූලාශ්‍ර වල එතරම් තොරතුරු හමු නොවන ආර්ථික අංශය පිළිබඳව තොරතුරු රැසක් සෙල්ලිපි වලින් හමුවේ.
  - ගොඩවාය ලිපිය - බදු
  - බදුලු ටැම් ලිපිය - වෙළඳ බදු සහ වෙළඳ ද්‍රව්‍ය, රාජ්‍ය නිලධාරීන්ගේ අක්‍රමිකතා
  - තෝනිගල සෙල්ලිපිය - සමකාලීන බැංකු ක්‍රමය, පොලිය හා වෙළඳ ශ්‍රේණි
  - දෙවනගල සෙල්ලිපිය - විදේශ වෙළඳාම, විදේශ ආක්‍රමණ
  - තිරියාය ලිපිය - වෙළඳාම
  - බදු වර්ග - දකපති, බොජකපති ආදී
  - විවිධ හිමිකම්, නිල නාම, දේපල හිමිකම්, දේපල පැවරීම ආදිය පිළිබඳ තොරතුරු
  - විවිධ වෘත්තිකයන් පිළිබඳ තොරතුරු
  - ආගමික ආයතන වලට කරන ලද පරිත්‍යාග හා ඊට අලාළ නීති රීති
  - ස්ථාන නිවැරදිව හඳුනා ගත හැකි වීම - නකදිව (නාගදීපය)
    කාචරගාම (කතරගම)
- භාෂා පරිණාමය සහ අක්ෂර විකාශය වැනි අංශ පිළිබඳ තොරතුරු ලබාගත හැකි වීම.
- කෙසේ වෙතත් අභිලේඛන වලින් පමණක් සවිස්තර කාලනිර්ණයානුකූල ඉතිහාසයක් ගොඩනැගීම දුෂ්කර වේ.

**ii)** පුරාවස්තු හා නටඹුන්

- පූර්ව ඓතිහාසික යුගයට අයත් පොසිල, ක්ෂුද්‍ර ගල් ආයුධ ආදී දෑ සහ තත් කාලයට අයත් අස්ථි, පබළු හා වළං ආදී දෑ මගින් මානවයා පිලිබඳ තොරතුරු රැසක් හෙළිවේ.
- වැව් හා ඇළ මාර්ග නටඹුන් මගින් තාක්ෂණය හා ජීවන රටාව පිළිබඳ තොරතුරු හෙළිවේ.
- පුරාණ රෝහල් හා සම්බන්ධ නටඹුන් වලින් හා පුරාවස්තු වලින් සෞඛ්‍ය හා ස්වස්ථතාවය පිලිබඳ තොරතුරු අනාවරණය වේ.
- තත්කාලීන වාස්තු විද්‍යාව පිළිබඳ දාගැබ් හා ගොඩනැගිලි මඟින් හෙළිවන තොරතුරු.
- සීගිරිය වැනි ස්ථාන වලින් හමුවන නටඹුන් මගින් නගර නිර්මාණය හා ආරක්ෂාව ආදී අංශ පිළිබඳව තොරතුරු හෙළිවේ.
- ආගමික හා ලෞකික ජීවිතය, විදේශ බලපෑම හා තාක්ෂණය ආදී අංශ පිළිබඳව තොරතුරු බොහෝමයක් හෙළි වේ.
- චිත්‍ර, මූර්ති හා කැටයම් ආදියෙන් තත්කාලීන කලාව හා කලා රසිකත්වය පිබඳ තොරතුරු අනාවරණය වේ.

**iii)** නාණක

- තත්කාලීන ආර්ථිකය පිළිබඳ නිවැරදි තොරතුරු හෙළි කර ගැනීමට උපකාරී වේ. විදේශ රටවල් සමග ගනු දෙනු කල ආකාරය හා කවර රටවල් සමග ගනු දෙනු කළේද යන්න.

- කාසි නිකුත් කළ පාලකයන්, ඔවුන්ගේ විරුද නාම හා නිකුත් කළ වර්ෂ පිළිබඳ තොරතුරු හමුවේ.
- කාසි නිෂ්පාදනය කොට ඇති ලෝහ මගින් ආර්ථිකය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වීම හා කාසි නිර්මාණයේ විකාශනය මගින් තාක්ෂණයේ වර්ධනය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වීම.
- කාසි වල දක්නට ලැබෙන ඇතැම් රූප මගින් තත්කාලීන සමාජයේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ අදහසක් ලබා ගත හැකි වීම.

03.

**i)** රජු මුහුණ දුන් දේශීය හා විදේශීය අභියෝග සහ එතුමා ඒවා ජයගත් අන්දම

- වට්ටගාමිණී අභය රජු දේශීය හා විදේශීය අභියෝග රැසකට මුහුණ දුන් පාලකයෙකි. එම සෑම අභියෝගයක්ම ජයගෙන විදේශිය ආක්‍රමණිකයන්ගෙන් රට බේරාගත් පාලකයෙක් ලෙස ඔහු ලක් ඉතිහාසයේ වැදගත් වේ.
  - මහාරත්තක ඝාතනය කොට රාජ්‍ය ලබා ගැනීම.
  - තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල.
  - සත් ද්‍රවිඩ ආක්‍රමණය
  - ගිරි නිගණ්ඨයාගේ විරෝදය
  - බැමිණිටියා සායට මුහුණපෑම
  - තනිව සේනා සංවිධානය කර ගැනීම
  - සේනාපතිවරුන් රජු හැර යාම

**ii)** අභයගිරි විහාරය පිහිටුවීම

- ක්‍රි.පූ. 89 දී දාඨිය මරා අනුරාධපුර රාජ්‍ය බලය නැවත ලබා ගැනීමෙන් පසුව ගිරි නිගණ්ඨ ආරාමය කඩා බිඳ දමා අභයගිරි විහාරය තැනවීම.
- සැඟව සේනා සංවිධානය කළ අවධියේ රජුට උපහාර කළ කුපික්කුල මහා තිස්ස තෙරුන්ට අභයගිරි විහාරය පූජා කිරීම.
- මහා විහාරයෙන් ඉවත් වූ භික්ෂු පිරිස් අභයගිරියට එක්වීම හා සංඝ භේදයට මග පෑදීම.
- රජුගේ විශේෂ අනුග්‍රහය අභයගිරියට හිමිවීම.
- පසුකාලීනව මහායාන අදහස් අභයගිරියට බලපෑමත් විදේශීය බෞද්ධ මධ්‍යස්ථාන සමඟ සබඳතා පැවැත්වීමත් නිසා අභයගිරිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම.

**iii)** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

- බැමිණිටියාසාය නිසා භික්ෂු පරම්පරා මෙන්ම එතෙක් මුඛපරම්පරාගතව ආරක්ෂා කරගෙන ආ ත්‍රිපිටක ධර්මය ද අභාවයට පත් වීමේ තර්ජනයක් මතු වීම.
- වට්ටගාමිණී අභය පාලන සමයේදී ප්‍රාදේශීය පාලකයෙකුගේ අනුග්‍රහය යටතේ මාතුල ජනපදයේ ආලෝක ලෙනේ දී ත්‍රිපිටකය හා අට්ඨකතා පළමුවරට ග්‍රන්ථාරූඪ කරනු ලැබීම.
- අභියෝග හමුවේ වුවද ථෙරවාදී බුදු දහම මෙරට ස්ථාපිත කිරීමට එමගින් හැකි වීම.

04)

**i)** දිවයින එක්සේසත් කිරීම

- දක්ඛිණ දේශයේ පාලකයා බවට පත් වීම. පඬුවස්නුවර (පරාක්‍රමපුරය) පාලන මධ්‍යස්ථානය කර ගැනීම.
- රජරට අල්ලා ගැනීම සඳහා ජයබාහු සමඟ සටන් කිරීම.

- මලය දේශය යටත් කර ගැනීම
- පොළොන්නරුව අල්ලා ගැනීම - II වන ගජබාහු සමඟ සම්මුතියකට එළඹීම.(සංගමු විහාර සෙල්ලිපිය) II වන ගජබාහුගෙන් පසු මනාභරණට එරෙහිව සටන් කිරීම. ක්‍රි:ව: 1153 දී පොළොන්නරුවේ රජකමට පත් වීම.
- රුහුණේ කැරලි ඇති වීම. සුගලා බිසව පරාජය කිරීමෙන් එම කැරලි මර්දනය කිරීම.
- අගනගරය වූ පොළොන්නරුව මුල් කරගෙන මධ්‍යගත පරිපාලන සංවිධානයක් ගොඩනැගීම.

**ii)** ආගමික සේවය

- සංඝ සංශෝධනයක් ඇති කොට සාමග්‍රියක් ඇති කිරීම. භික්ෂූන් එක්සේසත් කොට සඟරජ හිමිගේ නායකත්වය යටතේ සඟ පරපුරක් බිහි කිරීම.
- භික්ෂු කතිකාවතක් පොළොන්නරුවේ ගල් විහාරයේ පිහිටු වීම.
- ආලාහන පිරිවෙන මුල් කොටගත් වෙහෙර විහාර රැසක් පොළොන්නරුවේ ඉදිකර වීම.
- වෙනත් ප්‍රදේශ වල වෙහෙර විහාර ගොඩනැංවීම හා ප්‍රතිසංස්කරණය කිරීම.
- අග්නිදිග ආසියානු ප්‍රදේශ සමඟ ආගමික සබඳතා පවත්වාගෙන යාම.

**iii)** වාරි කටයුතු හා ආර්ථික සංවර්ධනය

- දක්ඛිණ දේශයේ පාලකයා වශයෙන් සිටියදී දැදුරු ඔය ආශ්‍රිතව කළ වාරි මාර්ග කටයුතු.(අමුණු - කොට්ඨ බද්ද, දෝරදන්තික)
- ඒ ආශ්‍රිතව විශාල ඉඩම් ප්‍රමාණයක් අස්වද්දා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.
- මුළු දිවයිනේම පාලකයා වීමෙන් පසුව කරන ලද වාරි කටයුතු.
- පරාක්‍රම සමුද්‍රය ඇතුළු සංකීර්ණ වැව් ජාලය, වැව් ඒකාබද්ද කිරීම, ඇළවල් රාශියක් ඉදිකරවීම.
- රට සහලින් ස්වයංපෝෂිත කරවීම.
- වැව් ප්‍රතිසංස්කරණය කරවීම. - මින්නේරිය, කවුඩුල්ල, ගිරිතලේ

**iv)** විදේශ සබඳතා

- බුරුම ආක්‍රමණය.(රාමඤ්ඤ දේශය)
- දකුණු ඉන්දියාවේ චෝල විරෝධී පාණ්ඩ්‍යයන්ට ආධාර පිණිස හමුදා යැවීම නිසා චෝලයන් සමඟ ගැටුම් ඇතිකර ගැනීම.
- කාම්බෝජය සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම.

05)

**i)** ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන

- තමා ජීවත් වන සමාජය පිළිබඳ මෙන්ම ලෝකය පිළිබඳව පැහැදිළි අවබෝධයක් ලබා ගැනීම.
- වර්තමානය හොඳින් අවබෝධ කර ගැනීමට හැකි වීම.
- අනාගතය හැඩ ගසා ගැනීම සඳහා අතීතයෙන් ආදර්ශ ලබා ගැනීම.
- සමාජයේ, ලෝකයේ දේශපාලන සිද්ධි හා බලවේග අවබෝධ කර ගැනීම.
- ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම පහසු වීම.
- ජාතික සමගිය ගොඩනැගීමට හා අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම.
- ඉතිහාසය වෙනස් වන තත්වයන් පැහැදිලි කරන්නක් වීම.
- කාලය හා අවකාශය පිළිබඳ අදහස් වර්ධනය වීම.

- අවකාශය හඳුනා ගැනීම.
- විවේචනාත්මක චින්තනය වර්ධනය වීම.
- මිනිස් ස්වභාවය හඳුනා ගැනීමට සහ ඒ ආශ්‍රයෙන් තමා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම.

**ii)** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය

- ප්‍රාග් ඓතිහාසික යුගය - පුරා ශිලා යුගය - පහළ පුරා ශිලා යුගය
  - මධ්‍ය පුරාශිලා යුගය
  - ඉහළ පුරාශිලා යුගය
  - මධ්‍ය ශිලා යුගය
- පුරා ශිලා යුගය
  - පහළ පුරාශිලා යුගය - අර්ධ ශුෂ්ක කලාපයේ වෙරාළාශ්‍රිත ප්‍රදේශ (ඉරණමඩු පාංශු කලාපය), පහත රට තෙත් කලාපයට අයත් රත්නපුර අවට නිම්න ප්‍රදේශ.
  - මධ්‍ය පුරාශිලා යුගය - අදින් වසර 125000 සිට 75000ක පෙර කාල සීමාව බූන්දල, පතිරාජවෙල, වැල්ලෙගංගොඩ, මිනිහාගල්කන්ද
- මධ්‍ය ශිලා යුගයේ ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන - පාහියන්ගල, කුරුවිට, බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන, ගම්පහ අලවල ලෙන, බෙල්ලන්බැඳිපැලැස්ස, සීගිරිය පොතාන, මාතොට.
- ප්‍රාග් ඓතිහාසික තාක්ෂණය - ජීවන රටාව, ආහාර රටාව, අභිචාර ක්‍රම, ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ශරීර ස්වභාවය.

**iii)** මාගම රජ පෙළපත

- දේවානම්පියතිස්ස රජුගේ සහෝදරයා වූ මහානාග රෝහණයේ මාගම කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදි.
- මහානාගගෙන් ආරම්භ වන මාගම රජ පෙළපතේ අනෙකුත් පාලකයින් වූයේ යඨාලතිස්ස,ගෝඨාභය හා කාවන්තිස්සයි.
- මාගම රජ පෙළපතේ සුවිශේෂී පාලකයා වූයේ කාවන්තිස්ස රජුය. රෝහණය එක්සේසත් කොට එය ශක්තිමත් රාජ්‍යයක් ලෙස ගොඩනැගීම.

**iv)** වසභ රජුගේ වාරි කටයුතු

- ආර්ථික වශයෙන් කෘෂිකර්මාන්තය දියුණු කිරීම.
- මහ වැව් තැනවීමේ පුරෝගාමියා වීම.(මහවැව් 11ක්, ඇළවල් 12ක් ඉදිකළ බව මහාවංශයේ සඳහන් වේ.) මහවිලච්චිය වැව, මානාකැටිය වැව, නොච්චිපොතාන වැව, හිරිවඩුන්න වැව හා ඇළහැර හෙවත් අලිසාර ඇළ, මිනිපේ ඇළ ඉදි කිරීම.

## C කොටස

06)

- සියවස් ගණනාවක් පැවති මෙම ශිෂ්ටාචාරය ක්‍රි:ව: 13 වන සියවසේ පමණ සිට ක්‍රමයෙන් බිඳ වැටීම.

අනුරාධපුරය

- දුර්වල පාලකයන් පත් වීම.(V වන සේන/V මිහිඳු)

- රජ පෙළපත් අතර බල අරගල නිරන්තරයෙන් හට ගැනීම.(මෞර්ය හා ලම්බකර්ණ ගැටුම)
- දකුණු ඉන්දීය ආක්‍රමණ.(පාණ්ඩ්‍ය/චෝළ)
- ආක්‍රමණිකයන් රාජ්‍ය භාණ්ඩාගාරය කොල්ල කෑම,බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම.
- නිරන්තර ගැටුම හා යුද්ධ නිසා වාරි කර්මාන්ත පිරිහීම.
- වේලයින්කාර්/අගම්පඩි කුලී හමුදා සේවය ලබා ගැනීම හා ඔවුන්ගේ ක්‍රියාකලාපය.
- ඉන්දීය චෝළ අධිරාජ්‍යයේ බල ව්‍යාප්තියේ බලපෑම ක්‍රි.ව.993 දී I රාජ රාජ ආක්‍රමණය, ක්‍රි.ව.1017 දී රාජේන්ද්‍ර චෝල ආක්‍රමණය.

07)

දේශපාලන

- කාලිංග මාඝ පලවාහැරීමට පියවර ගැනීම.
- මායා රට කේන්ද්‍ර කරගෙන තුන්වන විජයබාහු රජු විසින් ගොඩනගන ලද දඹදෙණි රාජධානිය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.
- චන්ද්‍රභානුගේ ආක්‍රමණය කිරීම.

සංස්කෘතිය

- ආගමික ස්ථාන දියුණු කිරීම.
- දළදා පෙරහැර ආරම්භ කිරීම.
- උගතුන්ට අනුග්‍රහ දැක්වීම.

08)

- යාපනය රාජධානිය පිළිබඳ යාල්පානවෛපමාලෛයි, ශෙගරා සේකරමාලෛයි, කෛලාසමාලෛයි, රාජාවලිය, නිකාය සංග්‍රහය, සැළලිහිණි සංදේශය වැනි මූලාශ්‍ර වැදගත් වීම.
- ක්‍රි.ව.13 වන සියවස අග වන විට ජාවක චන්ද්‍රභානු විසින් යාපන ප්‍රදේශයේ බලය පැතිරීම.
- පාණ්ඩ්‍යයන්ගේ ආධාරයෙන් II වන පරාක්‍රමබාහු රජු විසින් චන්ද්‍රභානු පරාජය කළ පසු පාණ්ඩ්‍යයන් සිය නියෝජිතයෙකු ලෙස චන්ද්‍රභාණුගේ පුත්‍රයෙකු උතුරු ප්‍රදේශයේ පාලනයට පත් වීම.
- 1310 - 1311 අතර කාලයේ ආර්ය චක්‍රවර්තීන් උතුරේ පාලන අල්ලා ගැනීම.
- ආර්යචක්‍රවර්තීන් බ්‍රාහ්මණ කුලයට අයත් වූ අතර ඔවුන් පාණ්ඩ්‍ය රාජධානියේ දකුණේ ප්‍රදේශයක් වූ චෙව්වරුක්කයිනාටු නම් ප්‍රදේශයේ අධිපතීන්ගේ පවුලකින් පැවත ඒම.
- ආර්ය චක්‍රවර්තී පාලකයෝ 12 ක් පිළිබඳ වාර්තා වේ.
    1. ශිංගෙ ආර්යණ් (විංකෙයාර්යර්), එනම් විජය කුලංගෙ පළමු පාලකයා වීම.
    2. කුලශේකර ශිංගෛ ආරියණ්
    3. වික්කිරම ශිංගෛ ආරියණ්
    4. වරෝදය ශිංගෛ ආරියණ්
    5. මාර්තාණ්ඩ ශිංගෛ ආරියණ්
    6. කුණ පූෂණ ශිංගෛ ආරියණ්
    7. විරෝදය ශිංගෛ ආරියණ්
    8. ජයවීර (චෙයවීර) ශිංගෛ ආරියණ්
    9. කුණවීර ශිංගෛ ආරියණ්
    10. කනගශූරිය(කණකශූරිය) ශිංගෛ ආරියණ්
    11. පරරාජශේකරන්
    12. සංකිලි

- ක්‍රි.ව.1344 දී ලංකාවට පැමිණි ඉබන් බතුතා විසින් ආර්යචක්‍ර වර්තී පාලකයා "ලංකාවේ සුල්තාන්" ලෙස හඳුන්වා දෙනු ලැබීම.
- III වන වික්‍රමබාහු රජ දවස ආර්ය චක්‍රවර්තී ගම්පොළ රාජධානියේ ඇතැම් ප්‍රදේශවලට පහර දී බදු අය කර ගැනීම නිසා අලකේශ්වර ප්‍රභු රාජයා කෝට්ටේ බලකොටුව ගොඩනගා ආර්යචක්‍රවර්තීන්ගේ බලය මර්දනය කර එම ප්‍රදේශ මුදා ගැනීම.
- VI වන පරාක්‍රමබාහු රජු සපුමල් කුමාරයා යවා ආර්යචක්‍රවර්තී පරාජය කර යාපනය අල්ලා ගැනීම.
- පෘතුගීසීන් විසින් ක්‍රි.ව.1619 දී යාපනය අල්ලා ගැනීම.

09)

**i)** කෝට්ටේ යුගයේ සංස්කෘතික අභිවර්ධනය

- මෙහිලා අධ්‍යාපන හා සාහිත්‍ය අංශ වඩාත් කැපී පෙනීම.

අධ්‍යාපනය

- 6 වන පරාක්‍රමබාහු රජ සමයේ පැවති දේශපාලන, ආර්ථික, ආගමික හා ශාසනික දියුණුව මෙන්ම රාජ්‍ය අනුග්‍රහයත් අධ්‍යාපනයේ වර්ධනයට පිටු බලයක් විය.
- වීදාගම ශ්‍රී සනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කැරගල පද්මාවතී, පැපිලියානේ සුනේත්‍රාදේවි හා එරබත්ගොඩ ධර්මරාජ යන පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.
- මෙම අධ්‍යාපන ආයතන වල සිටි භික්ෂූන් වහන්සේ විශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක නිරත වීම.(කැරගල වනරතන, වීදාගම මෛත්‍රීය හිමි, වෑත්තෑවේ හිමි ආදී තෙරුන්වරුන්)
- මෙම අධ්‍යාපන මධ්‍යස්ථාන වල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රකෘත හා දෙමළ වැනි භාෂා ද කාව්‍ය, නාටක, ජෝතිෂ්‍ය විද්‍යාව වැනි විවිධ විෂයන් ද ඉගැන්විය.

**ii)** යාපහුව රාජධානිය

- පළමු වන බුනෙකබාහු රජු (ක්‍රි.ව. 1272 - 1284)
  - ක්‍රි.ව. 1272 දී දඹදෙණියේ රාජ්‍යත්වයට පත් වී කලක් එහි රාජ්‍ය විචාරා සිය පාලන මධ්‍යස්ථානය බවට යාපහුව තෝරා ගැනීම.
  - කදලිවාට, ඇපාන, තිප, හිමියානක යන නම් වලින් හැඳින්වුණු සිංහල වන්නි ප්‍රධානීන්ගෙන් එල්ල වුණු තර්ජනයකට මුහුණ දීමට සිදු වීම.
  - කාලිංගරායර හා චෝඩංග යන අය මෙහෙය වූ දකුණු ඉන්දියානු ආක්‍රමණයකට ද මුහුණ දීමට සිදු වීම.
  - විදේශ රටවල් සමග සබඳතා ගොඩනගා ගැනීම.
    උදා:- ඊජිප්තුවට යැවූ දූත ගමනක් පිළිබඳව අරාබි ලේඛනයක සඳහන් වීම.

**iii)** ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය

- දකුණු ඉන්දියානු කලාකරුවන් මෙරටටපැමිනීම හ ඔවුන් මෙරට කලා කටයුතු වල නිරත වීම.
  උදා:- ධර්මකීර්ති නම් හිමි සමග පැමිණි ගණේවරාචාර්ය ඇතුළු කලාකරුවන් පිරිස ගඩලාදෙණිය, ලංකාතිලකය, විජයෝත්පාය, නියම්ගම්පාය ආදී වෙහෙර විහාර ඉදිවීම.
- විහාරවල හා දේවාලවල දැව හා ශෛලමය කැටයම් මෙකල ජනප්‍රිය වීම.
- ඇම්බැක්කේ කැටයම් මෙම යුගයට අයත් සේ සැලකේ.

**iv)** සීතාවක රාජධානියේ බිඳවැටීම

- 16 වන සියවසේදී ආරම්භ වූ සීතාවන රාජධානිය එම සියවස අවසන් වීමට පෙර බිඳ වැටුණි.
- 1521 විජයබා කොල්ලයෙන් පසුව මායාදුන්නේ කුමරුට පරිපාලනය සඳහා පවරා දුන් පාලන ප්‍රදේශ මෙම රාජධානියේ මුල් අවස්ථාවයි.
- ඊට හතර කෝරළේ, දෙනවක හෙවත් පස් කෝරළේ, හේවාගම් කෝරළෙන් අඩක් හා කුරුවිට, ඇතුළුගම්, පනාවල්, හඳුන්දූනු, බෙලිගල් හා දෙහිගම්පල් යන කෝරළ හය අයත් විය.
- 1538 දී පමණ රයිගම් බණ්ඩාර මිය ගිය පසුව රයිගම් රාජ්‍යයට අයත් ප්‍රදේශ ද මායාදුන්නේ විසින් සීතාවක රාජ්‍යයට ඈදාගන්නා ලදි.
- කෝට්ටේ හත්වන බුවනෙකබාහු රජු හා පෘතුගීසීන් අතර සබඳතා වර්ධනය වීමට සමගාමීව සීතාවක - කෝට්ටේ අතර සබඳතා පළුදු විය. අවස්ථා ගණනාවකදී යුද්ධ හටගැණිනි.(1527-1536/1539-1547)
- 1542 න් පසුව උඩරට ප්‍රදේශයෙන් ද සීතාවකට තර්ජන එල්ල විය.
- 1557 න් පස්ව ධර්මපාල රජු ප්‍රතික්ෂේප කරමින් කෝට්ටේ ජනයා මායාදුන්නේගේ නායකත්වය පිළිගැනීම සීතාවක නැගීමට ප්‍රබල බලපෑමක් ඇති කළේය.
- ගිහි පැවිදි පඬිවරුන් විවධ අංශ වලට අයත් ග්‍රන්ථ රචනයෙහි නිරත වීම.(මහා කාව්‍ය, බුදුගුණ කාව්‍ය, සංදේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ, ප්‍රශස්ති ග්‍රන්ථ ආදිය)
- වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් තරගයට ග්‍රන්ථකරණයෙහි නියැලීම හේතු කරගෙන සාහාත්‍ය ප්‍රබෝධයක් හට ගැනීම.වනවාසී සම්ප්‍රදාය කැරගල පද්මාවතී පිරිවෙනෙහි ග්‍රාමවාසී සම්ප්‍රදාය තොටගමුවේ විජයබා පිරිවෙනෙහි ද ක්‍රියාත්මක වීම.
- මෙකල පැවති අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර කීර්තියට පත්වී තිබීම. සංස්කෘතික විශාරදයෙකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා දිවයිනට පැමිණීම.

සාහිත්‍ය

- ගිහි පැවිදි අධ්‍යාපනය දියුණු  වීම හා සාහිත්‍යයේ දියුණුවක් ඇති වීම.
- එකල විසූ ගිහි පැවිදි පඬිවරුන්ගේ සාහිත්‍යයේ දියුණුවට සුවිශේෂි දායකත්වයක් ලැබීම.
- 1578 දී රජ පත් I වන රාජසිංහ යටතේ පෘතුගීසි විරෝධී ප්‍රධාන බලවේගය බවට සීතාවක රාජධානිය පත් වීම.(1562 මුල්ලේරියා සටන)
- 1580 දශකයේදී පෘතුගීසින් හා යුධාවතීර්ණ වූ I වන රාජසිංහ කොළඹ කොටුව වැටලීම.(1581/1588)
- උඩරට ආක්‍රමණය කළ හෙතෙම එම ප්‍රදේශ ද සීතාවකට ඈදා ගත්තේය. මෙය සීතාවක බල ව්‍යාප්තියේ ප්‍රබල අවස්ථාවකි.
- I වන රාජසිංහ රජු ගෙන ගිය බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය හේතු කරගෙන සීතාවක රාජධානියට පැවති ජනතා සහයෝගය බිඳ වැටුණි.
- 1592 රජු මියයාමත් සමග හටගත් දේශපාලන අරගලය හේතු කරගෙන සීතාවක රාජධානිය බිඳ වැටුණි.